# පාසල්වල උසස් පෙළ සිසුන්ගේ අධ්‍යාපනික ගැටලු හා එම ගැටලු අවම කර ගැනීමට විධිමත් උපදේශන සේවයකින් ලද හැකි සහාය පිළිබඳව සිදු කරනු ලබන අධ්‍යයනයක්

**එච්. විපුල ශ්‍රී නන්ද**

ලි.ප. අංකය : 2006/Mphil /11

ශාස්ත්‍රවේදී උපාධි - පේරාදෙණිය විශ්ව විද්‍යාලය

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (සම්මාන) - කොළඹ විශ්ව විද්‍යාලය

උපදේශනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා - කොළඹ විශ්ව විද්‍යාලය

අධ්‍යාපනපති - කොළඹ විශ්ව විද්‍යාලය

UCLIB

554693

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ

2007/2008 අධ්‍යාපන දර්ශනපති පාඨමාලාවේ අවශ්‍යතා පූර්ණය සඳහා

උපදේශනය විෂය ක්ෂේත්‍රය යටතේ ඉදිරිපත් කරනු ලබන නිබන්ධනයයි.

2009.12.29

## සංක්ෂේපයෙන්.....

පාසල් ජීවිතයේ අ.පො.ස. (උ.පෙළ.) අධ්‍යයන කාල සීමාව පාසල් දරුවකුට ඉතාමත් තීරණාත්මක සන්ධිස්ථානයකි. එයට හේතුව අවු. 13 ක පාසල් ඉගෙනුමෙහි අවසාන ඵලය උසස් පෙළ ප්‍රතිඵලයයි. අනෙක් අතට සිය ඉදිරි ජීවිතයේ පදනම ශක්තිමත් කරන්නේ ද මෙම කඩඉමයි. සීමිත ඉඩකට හිමිකම් කීම සඳහා අධික තරගකාරී අධ්‍යාපන රටාවකට හුරුවී සිටින මෙම සිසුන් මුහුණදෙන අධ්‍යාපනික ගැටලු රාශියකි. එම ගැටලුවලට උපදේශන සේවයකින් සාර්ථක ප්‍රතිඵල ලබාගත හැකි අතර ඒ පිළිබඳ දැනුවත් බවක් ඇති බව පෙනෙන්නේ ද අතලොස්සකට පමණි. අනෙක් අතට පාසල් පද්ධතිය තුළ උසස් පෙළ සිසුන් උපදේශන සේවයේ පැතිම දක්නට ලැබෙන්නේ ද මද වශයෙනි.

අධ්‍යනයේ මූලික අරමුණු දිශාගත වූයේ පැති කිහිපයක් ඔස්සේය. සිසුන්ගේ අධ්‍යාපනික ගැටලුවල ස්වභාවය හඳුනා ගැනීම, උපදේශන සේවාවෙන් එම ගැටලු විසඳා ගැනීම සිසුන් විසින් කොපමණ දුරට දයකකර ගන්නේ දැයි විමසීම, උසස් පෙළ සිසුන්ගේ ගැටලු විසඳා ගැනීමට උපදේශන සේවාවෙන් ලැබිය හැකි පිහිට පිළිබඳ ඔවුන් තුළ ඇති අවබෝධය, එහිදී උපදේශක වරුන්ගේ දයකත්වයේ ස්වභාවයත් උපදේශන සේවය සඳහා විදුහල්පති හා ගුරු භවතුන්ගේ දයකත්වයේ ස්වරූපය, හා සිසු ගැටලු විසඳාගැනීම සඳහා පවතින උපදේශන සේවය තවදුරටත් විධිමත් ලෙස සංවර්ධනය කළ හැකි ආකරය විමසීම යන අරමුණුය.

සිසුන්ගේ ගැටලු පිළිබඳව විමසීමේ දී සෑම සිසුවෙකුව කුමන හෝ ගැටලුවකට මුහුණදෙන බවත් ඇතැමුන් විවිධ ආකාරයේ ගැටලුවලට මුහුණදෙන ආකාරයත් දක්නට ලැබිණි. වැඩියෙන්ම මුහුණදී තිබුණු ගැටලු ලෙස පවුල් ආශ්‍රිත ගැටලු හා ප්‍රේම සබඳතා පිළිබඳ ගැටලු ලෙස වාර්තා විය. අධ්‍යාපනික ගැටලු හැරෙන්නට, මානසික ගැටලු, කායික ගැටලු, ආරක්ෂක ගැටලු විවිධ භීතිකා වැනි විවිධ ගැටලු වලට ද සිසුන් මුහුණදෙන බවක් දක්නට ලැබුණි. සිසුන් උපදේශන සේවය පිළිබඳ දැන සිටි පිරිස ඉතා සීමිත වූ අතර එය ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොවීය. අධ්‍යනය තුළ දී හෙළි වූ වඩා වැදගත් කරුණක් වූයේ අධ්‍යාපනික ගැටලු සඳහා උපදේශන සේවයකින් ලද හැකි පිහිට කෙතෙක්ද? එමෙන්ම ඒවා විසඳා ගැනීමට

උපදේශන සේවයේහි ඇති ශක්‍යතාවය පිළිබඳව සිසුන් දැනුවත් වී නොසිටීමයි. උපදේශන සේවය ලබාගැනීම සඳහා සුළු පිරිසක් ඉදිරිපත් වී තිබූ අතර ඔවුන් ඉන් සාර්ථක ප්‍රතිඵල ලබා තිබුණි.

ගුරුවරුන්ගේ පාර්ශවයෙන් එතරම් සාර්ථක දායකත්වයක් උපදේශන සේවාව පවත්වාගෙන යාම සඳහා ලැබෙන බවක් දක්නට නොලැබුණි. ඒ සඳහා හේතු වූයේ ගුරුවරු උපදේශන සේවය පිළිබඳ වඩා නිවැරදි අවබෝධයක් නොලබා තිබීමත්, උපදේශකවරයා විසින් පාසලේ උපදේශන සේවාව පවත්වාගෙන යන ආකාරයේ ස්වභාවයත් යන කරුණු බව හෙළිවිය. ඒ සඳහා උපදේශකවරයා හෝ වරිය විධිමත් පුහුණුවක් නොලබා තිබීමත්ය.එය සිසු ගැටලු විසඳා ගැනීම සඳහා මනෝවිද්‍යාත්මක ප්‍රතිකාර සැලසුම් කිරීමට ඇති නොහැකියාව නිසා පාසල තුළ උපදේශකවරයාගේ ක්‍රියාකාරිත්වය කැපී නොපෙනුණි. එසේම උපදේශන වැඩසටහන් තුළින් සිසුන් හා ගුරුවරයා අතරට යාමට උපදේශකවරයා අපොහොසත් වී තිබිණි.මෙම තත්ත්වය උපදේශකවරයා හා පාසලේ සෙසු ගුරුභවතුන් අතර සබඳතාවය දුරස්වීමට හේතුවී ඇත.

පාසල් පද්ධතිය සඳහා විදුහල්පති වරයාගේ දායකත්වය ඉතා ඉහළ වේ. විදුහල්පතිවරුන් උපදේශකවරුන් සඳහා දක්වන සහයෝගය හා උනන්දුව සතුටුදායකය. උපදේශකවරුන් හා උපදේශනය පිළිබඳ ආකල්පය ද ඉතා හොඳ මට්ටමක පවතින අතර උපදේශකවරුන් ඒ පිළිබඳව දක්වන උනන්දුව ගැනද සෑහීමකට පත්වේ. නමුත් විදුහල්පතිවරුන්ට අනුව ද උපදේශකවරුන්ගේ පුහුණුව හා ප්‍රතිකාරාත්මක දැනුම පිළිබඳව ඔවුන් සෑහීමකට පත්වන්නේ නැත. තවත් ප්‍රධාන ගැටලුවක් වන්නේ විදුහල්පතිවරුන් වැඩි ප්‍රමාණයක් උපදේශකවරුන් වෙත වගකීම් සහිත කාලසටහනක් පැවරීමයි. එයින් ඉවත් කිරීමට විදුහල්පතිවරුහු නොකැමති වෙති. මෙම තත්ත්වය විමසීමේ දී දැක්නට ලැබුණේ ඉගැන්වීමට දක්ෂ ගුරුවරුන් උපදේශනය සඳහා නිදහස් කිරීමට අකමැති බවයි. මෙම තත්ත්වය වෙනස්කර ගත යුතුව ඇත. කෙසේ වුවත් අධ්‍යනයට ලක් වූ විදුහල්පති නියදිය බහුල අත්දැකීම් පිරිසක් වීම සතුටට කරුණකි.

උපදේශකවරුන්ගේ පැත්තෙන් ද ගුරු ජීවිතයේ අත්දැකීම් බහුල පිරිසක් අධ්‍යනයට භාජනය විය. සියලු උපදේශකවරුන් වසර 10 ක සේවා කාලය ඉක්ම වූ අතර 60%

කට වඩා උපදේශකවරු පිරිසක් සිය සේවා කාලය අවු. 20 ඉක්මවා සිටියහ. මූලිකව ගැටලුව වූයේ ඔවුන් විධිමත් පුහුණුවක් ලබා නොතිබීමයි. එබැවින් ඔවුහු උපදේශනය පිළිබඳ පුළුල් දැනුමකින් හා ප්‍රායෝගික කුසලතා පිළිබඳ ගැටලුවලට මුහුණදී සිටියහ. ප්‍රතිකාරාත්මක සැලසුම් හා ඒවා ක්‍රියාත්මක කිරීමේ අවබෝධය නැති තරම් වේ. නමුත් එම දැනුම ලබාගැනීමේ අවශ්‍යතාවක් හා උනන්දුවක් ඔවුන් තුළ දක්නට ලැබුණු අතර ඒ සඳහා ඉල්ලීම් ද ඉදිරිපත් කරන ලදි. මේ තත්ත්වය මත ඔවුන් සිය කාර්යභාරය ඉටුකිරීමේ දී විවිධ ගැටලුවලට මුහුණදීමක් දක්නට ලැබුණි. පාසල තුළ ක්‍රියාකාරී දයකත්වය අඩුවීමට ද මෙම තත්ත්වය බලපා තිබුණි. කාලසටහනෙන් නිදහස් නොකිරීම ඔවුන්ට ප්‍රධාන ගැටලුවක් වූ අතර, සිය සේවයට බාධක ලෙස ඔවුන් දකින්නේ උපදේශනය පිළිබඳ ජනතාව තුළ අඩු දැනුම හා ගුරුවරුන්ගේ ආකල්ප, දෙමාපිය ආකල්ප හා සිසුන් තුළ පවතින ආකල්ප හා විශ්වාස වැනි කරුණු වේ.

පොදුවේ සලකන විට පාසල් පද්ධතිය තුළ පවතින උපදේශන සේවය තවදුරටත් සංවර්ධනය කරලීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ගණනාවක් පර්යේෂණය තුළින් හෙළිකර ගන්නා ලදි. පූර්ණ කාලීන උපදේශකවරයෙක් සමඟ ඔහුගේ හෝ ඇයගේ විධිමත් පුහුණුවට අමතරව නියමිත සුදුසු ස්ථානයක්, විධිමත් වාර්තා තබාගැනීමේ ක්‍රමයක්, පාසල් ප්‍රජාව දැනුවත් කිරීමේ ආකර්ෂණීය වැඩපිළිවෙලක්, දරුවන්ගේ ගැටලු හඳුනාගැනීමට ක්‍රමවත් වූ වැඩපිළිවෙලක් වැනි විවිධ සාධක ද ඒ අතර විය. මෙම තත්ත්වයන් ජයගෙන විධිමත් උපදේශන සේවයක් පවත්වාගෙන යන්නේ නම් සිසුන් මුහුණදෙන අධ්‍යාපනික ගැටලු වන උනන්දුව හීනවීම,විභාගයට බියවීම, කරුණු අමතකවීම, විෂයන් එපාවීම, පිළිතුරු ලිවීමට නොහැකි වීම, කාලය මදිවීම වැනි සිසුන් මුහුණදෙන සෑම ගැටලුවකටම විසඳුම් ලබාගත හැකිය. ඒ පමණක් නොව අධ්‍යාපනික ගැටලු ආශ්‍රයෙන් සිසුන් මුහුණදෙන විවිධ කායික සහ මානසික ආබාධ ගණනාවකටම වෛද්‍ය ප්‍රතිකාර වලින් තොර මනෝවිද්‍යාත්මක ප්‍රතිකාර තුළින් ඉතාමත් ඉක්මන් සුවයක් ලබාගත හැකිය. මේ මගින් අනාගත පරපුර නිරෝගී තරුණ පරපුරක් වනු නිසැකය.